**හපුතලේ ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27වන දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 17 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 24 දිනද, සභාපතිවරයාට යවා ඇත.

### 1.2. තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට හපුතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශිය ණය සංවර්ධන අරමුදලේ ණය ශේෂය ශේෂ සනාථ කිරීමේ ලිපිය අනුව රු.7,573,439 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල එය රු.7,725,316 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව පවත්වාගෙන යන බැංකු ගිණුමකට අදාලව මුදල් පොත අනුව ශේෂය රු.461,192 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු.329,266 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව පවත්වාගෙන යන බැංකු ගිණුමකට අදාල මුදල් පොත අනුව ශේෂය රු.274,456 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශන වල රු.374,456 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි උසාවි දඩ රු.1,775,480 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල රු.2,394,590 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (v) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සභාවට ලැබී තිබුණු රු.1,630,000 ක ප්‍රාග්ධන ලැබීම් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. |

**(ආ)** **<u>නොසැසඳීම්</u>**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණය හිමි ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.10,826,280 ක් වුවද උපලේඛන අනුව රු.9,977,903 ක් වූයෙන් රු.848,377 ක වෙනසක් විය. | උපලේඛන සමඟ සසඳා නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. |

1.4 <u>අනුකූල නොවීම්</u>

<u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්</u>

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | වර්ෂ 05 කට වරක් බදු කුලී තක්සේරු කර ගිවිසුම් වලට එළඹිය යුතු වුවද, කඩ කාමර 62 ක් තක්සේරු කිරිමකින් තොරව සහා තීරණයක් මත බාහිර පාර්ශවයන්ට බදු පදනම මත ලබාදී තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. | 2020 වසර සඳහා තක්සේරු කිරීම් සිදු කරමින් පවති. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,651,624 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,770,817 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල් කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 922,073 | 2,244,511 | 1,497,442 | 1,669,142 | 213,586 | 1,556,511 | 856,906 | 913,192 |
| ii. | කුලී | 670,543 | 2,747,290 | 4,016,291 | - | 716,157 | 3,678,040 | 2,641,740 | 1,752,457 |
| iii | බලපත්‍ර ගාස්තු | - | 600,000 | 1,336,295 | - | - | 500,000 | 697,078 | - |
| iv. | වෙනත් ආදායම් | 15,169,605 | 11,694,250 | 14,971,839 | 11,892,016 | 8,505,007 | 9,338,500 | 13,645,524 | 4,197,984 |
| | එකතුව | 16,762,221 | 17,286,051 | 21,821,867 | 13,561,158 | 9,434,750 | 15,073,051 | 17,841,248 | 6,863,633 |

### 2.2.2 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 03 කට අධික කාලයක සිට පැවත එන හිඟහිටි, ප්‍රාග්ධන ආධාර රු. 9,921,066 ක්, වෙනත් ආදායම් රු.389,983 ක්, වරිපනම් රු.1,123,853 ක් , අක්කර බදු රු.2,195 ක්, දඩ හා වරෙන්තු ගාස්තු රු.9,209 ක්, කඩ කුලී රු. 139,300 ක් , ගව මස් කඩ කුලී රු.102,702 ක්, පොල ගාස්තු රු. 55,620 ක්, කඩ කුලී දඩ රු.12,780 ක් හා වාහන බදු රු.955,299 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අය කරගත යුතුවේ. | අය කරගත හැකි ආදායම් අය කරමින් පවතින බව හා දීර්ඝ කාලයක සිට පැවත එන හිඟයන් කපා හැරීමට කටයුතු කරමි. |

### 2.2.3 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු.239,590 ක් හා හිඟ මුද්දර ගාස්තු රු.8,685,194 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ හා හිඟ මුද්දර ගාස්තු අයකරගත යුතුවේ. | අදාල සියලු උපලේඛන මේවනවිට ලැබී ඇති බව හා මුදල් ලබාගැනිමට පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 11 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා හෝ වැළඳගෙන හෝ නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු අංශ සඳහා සම්මත අතුරු ව්‍යවස්ථා පැනවීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතීන්ගේ “ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030” පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කර ගත හැකි වන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් හඳුනා ගැනීමේ දර්ශක සිව් අවුරුදු සැලැස්ම තුල දක්වා ඇත. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 03 කට අධික කාලයක සිට පැවත එන එකතුව රු.11,691,956 ක ගෙවිය යුතු ණය ශේෂ නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ණය ශේෂ නිරවුල් කළ යුතුවේ. | වියදම් ණයහිමි ශේෂය තුල ඇතුලත් වන්නේ සමාලෝචිත වර්ෂය තුල මිලදීගැනිම සඳහා අදාල වර්ෂය තුල නිරවුල් කිරිමට නොහැකි වූ බිල්පත් එකතුව පමණක් බවට පිළිතුරු ලබාදී ඇත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එක් තනතුරක් අතිරික්තව සහ තනතුරු 06 ක පුරප්පාඩු 11 ක් පැවතුනි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත හා පුරප්පාඩු සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | මේ සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. |
| (ආ) නිලධාරින්/සේවකයින් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.62,956 ක ණය මුදල් අය කරගෙන නොතිබුණි. | අදාල ණය මුදල් අය කරගත යුතුවේ. | අදාල නිලධාරින් දැනුවත් කර ඇති බව හා අය කරමින් පවතී. |

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | 2020 වර්ෂයේදි සැලැස්මක් සකස්කර නිසි පරිදි අභ්‍යන්තර විගණන වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට කටයුතු කරමි. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට එක්වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | සමාලෝචිත වර්ෂය තුල ආයතනික මට්ටමින් කමිටු 02 ක් පමණක් පවත්වන ලද බව හා පළාත් පාලන දෙපා.මට්ටමින් පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්විම් 02 ක් සඳහාද සහභාගවී ආයතනික ගැටළු පිළිබඳ සාකච්ඡා පවත්වා ඇත. |